ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
වාර්ෂික වාර්තාව - 2021

අනු අංකය විස්තරය පිටු අංකය

1: ආයතනයේ පිහිටීම 2

2: ආයතනයෙහි පරමාර්ථ 3

3. ආයතනයේ කර්තව්‍යන් 4

4: 2021වර්ෂය සඳහා නිර්දේශිත කළමනාකරණ මණ්ඩල තොරතුරු 5

5: 2021 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් 5

6: ආයතනයේ කාර්ය මණ්ඩලය - 2021 5

7: ආයතනයේ සංයුතිය 7

7.1 පාලන හා සැපයුම් අංශය 8

7.2 පුහුණු අංශය 9

7.3 සැලසුම් අංශය 18

7.4 ගිණුම් අංශය 21

1: ආයතනයේ පිහිටීම

1.1 කොළඹ ප්‍රධාන කාර්යාලය

2021 වර්ෂයේ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි ප්‍රධාන පරිපාලන කටයුතු සිදු කරනු ලැබුවේ අංක 321/1/**A,** හයිලෙවල් පාර, මාකුඹුර**,** පන්නිපිටිය යන ලිපිනය දරන ස්ථානයේය. දීප ව්‍යාප්තව, භාෂා ඉගැන්වීම පිළිබඳ විවිධ පාඨමාලා සැලසුම් කිරීම ,සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම**,** සියලු අමාත්‍යාංශ හා ආයතන සමඟ කාර්යක්ෂවම සම්බන්ධ වීම සහ ආයතනයෙහි සියලුම කර්තව්‍යන් වඩා හොඳින් පවත්වාගෙන යාම සඳහා කොළඹ කාර්යාලය ස්ථාපනය කර ඇත.

1.2 අගලවත්ත පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි අගලවත්ත භාෂා මධ්‍යස්ථානය කොළඹ සිට කි.මී. 100ක් පමණ දුරින් කළුතර දිස්ත්‍රික්කයෙහි අගලවත්ත, ගලේවත්ත නම් ප්‍රදේශයෙහි ස්ථාපනය කොට ඇත.

ජාතික වැවිලි කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පැවති අක්කර 2.5ක පමණ භූමී ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්න ලද තීරණයකින් අනතුරුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා ඇති අතර, ආයතනයෙහි ආරම්භය හා අභිවෘද්ධිය සඳහා මෙම භූමි පරිශ්‍රය ප්‍රබල ලෙස හේතු වී ඇත. භාෂා ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩා සෞන්දර්යාත්මකව, ප්‍රායෝගිකව සහ බුද්ධිවාදි ස්වරූපයෙන් සිදු කළ හැකි මනෝරම්‍ය වූ පරිසර ස්වභාවයකින් සහ මනස්කාන්ත භූමී නිමවුමකින් යුක්ත අගලවත්ත භාෂා පුහුණු මධ්‍යස්ථානය නේවාසික පහසුකම් සහිතව ස්ථාපිත කර ඇත.



2: ආයතනයෙහි පරමාර්ථ

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක්ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම.
- ලිඛිත නීතියකින් පිහිටුවන ලද භාෂා පරිවර්තන සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තන සේවයෙන් පත් කළයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවය ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තනයන් බිහි කිරීම.
- සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාව ඇති තැනැත්තන් පුහුණු කිරීම.



3: ආයතනයේ කර්තව්‍යන්

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දිගු කාලීන පුහුණුවක් ලබාදීම.
- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ හා අධ්‍යයන වල ප්‍රතිඵල භාවිත කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටලු පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම.
- සුදුසු තැනැත්තන්ට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම සහ එම පුහුණුවීම් සහ අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කරන අපේක්ෂකයින්ට සහතික පත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- භාෂා ඉගැන්වීමේ කාර්යය සිදු කිරීම සඳහා පුහුණු පුද්ගලයන්ගේ සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.
- භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ තොරතුරු තැම්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් සහ ලඝු ලේඛකයින් ආදී වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.



4: 2021 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල තොරතුරු

ආයතනයෙහි පරමාර්ථ වඩා කාර්යක්ෂමව සහ නිරවද්‍යතාවයෙන් සිදුකරනු වස් අදාළ සියලුම තීරණවල තීරකයා වශයෙන් පෙනී සිටිනුයේ කළමනාකරණ මණ්ඩලයයි. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතෙහි 3(1) වන වගන්තිය ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් කළමනාකරණ මණ්ඩලය පත්කරනු ලැබ ඇත.

2021 වසර සඳහා ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම 2021.07.15 පැවති අතර වර්ෂය තුළ කළමණාකරණ මණ්ඩල රැස්වීම් 02ක් පවත්වා ඇත.

5: 2021 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන්

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතෙහි අංක 07 පරිච්ඡේදයට අදාළව ගරු අමාත්‍යතුමන් විසින් ආයතනයේ අධ්‍යයන කටයුතුවලදී සැලසුම්, ප්‍රතිපත්ති සහ නිර්දේශ සඳහා අවශ්‍ය කොන්දේසි සහ වෙනත් කාර්යයන් වඩා නිවැරදිව සහ ඵලදායී ලෙස සිදුකරනු වස් විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් භාෂාව, වාග් විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර අළලා පහත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් පත් කරනු ලැබේ. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සංස්ථාපිත විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කරන ආචාර්ය සහ මහාචාර්යවරුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි එකඟතාවයෙන් පත්කරන ලද අතර, ආයතනයෙහි ඉදිරි දැක්මෙහි ප්‍රධාන නියෝජිතයන් වශයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනුවස් අධ්‍යයන මණ්ඩලය සෘජුව බැඳී සිටී.

2021 වර්ෂය මුළුල්ලේ පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආයතනයෙහි අධ්‍යයන මණ්ඩලය සම්පූර්ණයෙන් පත්වී නොතිබුණි.

6: ආයතනයේ කාර්ය මණ්ඩලය - 2021

ආයතනික කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

කළමනාකරණ මණ්ඩලයෙහි විධානයන්ට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයතනයෙහි පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.

1. ආයතනයේ පරිපාලන කටයුතු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව වගකීම
2. ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලයෙහි පත්කිරීම්, ආයතනික පරිපාලන කටයුතු
3. ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා නියාමනය

6.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

2021 වර්ෂය තුළ ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා (තාවකාලික පදනමින්) බඳවා ගැනීම් සිදු කරන ලදි. මේ අනුව,

නම	තනතුර	බඳවාගත් දිනය
ඒ.එම්.එස්.එන්. අතපත්තු මයා	කළමනාකරණ සහකාර	2020/03/02
මහේෂ් තැන්නේ මයා	කළමනාකරණ සහකාර	2020/03/02
බී. ඉන්දික ප්‍රසන්න බණ්ඩාර මයා	කාර්යාල කාර්යය සහායක	2020/03/02
කේ.එම්.ජී. බණ්ඩාරනායක මයා	කාර්යාල කාර්යය සහායක	2020/03/02
එච්.එම්. කලණ විදුරංග බණ්ඩාර මයා	රියදුරු	2020/03/02
එස්.ආර්.සී. ද සේරම් මෙය	සම්බන්ධීකරණ සහකාර	2020/10/06
ටී.එස්. ශාන්ත ද සිල්වා මයා	කළමනාකරණ සහකාර	2020/10/06
එච්.ජී.එන්.එන්. නිහාරි මෙය	කළමනාකරණ සහකාර	2020/10/06
පී.ඩබ්.ඩී.ඩී.බී. තිලකරත්න මයා	කාර්යාල කාර්යය සහායක	2020/10/06
බී.ජී.පී. කුමාරි මෙය	කාර්යාල කාර්යය සහායක	2020/10/06
එල්. වීරසේකර මෙය	සම්බන්ධීකරණ සහකාර	2020/12/18

6.2 ආයතනයේ කාර්ය මණ්ඩලය



තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අධ්‍යක්ෂ	02	01	01
සහකාර අධ්‍යක්ෂ	03	02	01
ගණකාධිකාරි	01	01	-
අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි	05	05	-
පරිපාලන නිලධාරි	01	01	-
අභ්‍යන්තර විගණන නිලධාරි	01	01	-
සම්බන්ධීකරණ සහකාර	08	10	
කළමණාකරණ සහකාර	08	12	
පුස්තකාලාධිපති	01	-	01
විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු	01	01	-
රියදුරු	05	06	-
කාර්යාල කාර්ය සහයක	04	06	-
එකතුව	41	45	03

7: ආයතනයේ සංයුතිය

ආයතනයෙහි කාර්යයන් ඉටුකර ගැනීමේ පහසුව සඳහා පහත සඳහන් අංශවලට වෙන් කර ඇත.

1. පාලන හා සැපයුම් අංශය.
2. පුහුණු අංශය.
3. සැලසුම් හා පර්යේෂණ අංශය.
4. ගිණුම් අංශය
5. අභ්‍යන්තර විගණන අංශය.

7.1 පාලන හා සැපයුම් අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරයි. ආයතනයේ සෙසු අංශවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින්, අංශ අතර සම්බන්ධීකරණ කටයතු මනාව පවත්වාගෙන යාමද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

එසේම ආයතනයේ අනෙකුත් සියලුම අංශවලට අවශ්‍ය කාර්යමණ්ඩලය නියමිත කාර්ය පටිපාටින් ඔස්සේ බඳවා ගැනීම, ඔවුන්ගේ ආයතනික සහ පරිපාලනමය කටයුතු ඉටුකරමින් සේවක සුබසාධනයත්, සේවක අභිප්‍රේරණයත් නංවාලමින් ඒ ඒ අංශවල කටයුතු ඵලදායි අන්දමින් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලසීමද පාලන අංශය මඟින් සිදු කරන කාර්යයකි.

පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ සහ ආයතනයේ සියලුම අංශවලට අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර මෙන්ම කාර්යාලයට දෛනිකව අවශ්‍ය වන කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමටද, වාහන නඩත්තු, ප්‍රවාහන පහසුකම් සැපයීම, ආරක්ෂක සේවාවන් සහ පිරිසිදු කිරීමේ සේවා සම්පාදනය කිරීම ආදී සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේද මෙම අංශය විසිනි. එමෙන්ම ආයතනයේ පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ද පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

7.1.1 පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය හා ඊට අනුබද්ධ පුහුණු ආයතනයේ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන සම්පත්දායකයන්ට, පුහුණු පාඨමාලා සඳහා සහභාගිවන්නන්ට සහ පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා සහය වන ආයතනයේ කාර්ය මණ්ඩලයට දැනුම සහ තොරතුරු රැස්කර ගැනීම සඳහා ඉගෙන ගැනීමේ පහසුකම් පුස්තකාලය මඟින් සපයාගත හැකිය.

භාෂා පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා විශේෂයෙන් උපකාරී වන විශේෂ පොත්පත්වලින් පරිපූර්ණ වී ඇති මෙම පුස්තකාලය, පරිපාලන, කළමනාකරණය, ගිණුම්කරණය, තොරතුරු තාක්ෂණය, භාෂාව, සාහිත්‍යය සහ සමාජ විද්‍යාව ආදී විෂයන් ආශ්‍රිත පොත්පත් සහ සඟරාවලින් සමන්විත වේ.

මෙයට අමතරව මෙම පුස්තකාලය ජාතික භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය උපකාර ග්‍රන්ථ, ශබ්ද කෝෂ, විශ්වකෝෂ, පාරිභාෂික පදමාලා හා වාග්කෝෂ ආදී විමර්ශන කෘති වලින් මෙන්ම පුහුණුවීම් සහ පුහුණු කිරීම්වලට අදාළ මෙවලම් කට්ටල, හා විවිධ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ එකතුවකින්ද යුක්ත වේ.

මේ හැර දෙවන භාෂාවක් අධ්‍යයනය කිරීමේදී අවශ්‍ය වන ග්‍රන්ථ හා විමර්ශන ද්‍රව්‍ය පිලිබඳ ග්‍රන්ථ නාමාවලියක්ද මෙහි පවති. චරිත ප්‍රධාන සහ අනුක්‍රමික සම්පාදනය මෙම පුස්තකාලය මඟින් ඉටු කරන තවත් සේවාවකි. මෙයට අමතරව භාෂාවලට අදාළ වූ කරුණු පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් ලෙස විවිධ භාෂා පිළිබඳ ජාතික වශයෙන් සිදු කරන පර්යේෂණ සහ අධ්‍යයන සම්බන්ධයෙන් වූ පොත් එකතුවක්ද පුස්තකාලය සඳහා යාවත්කාලීන කර ඇත.

7.2 පුහුණු අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ වඩා යහපත් යාන්ත්‍රණයක් ඇති කිරීම උදෙසා ජාතීන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කරමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් පිහිටුවන ලද මෙම ආයතනයෙහි එකී අරමුණ යථාර්ථයක් බවට පත්කර ලීම සඳහා ප්‍රමුඛතම දායකත්වය ලබා දෙන්නේ පුහුණු අංශය මගිනි.

ඒ අනුව, ආයතනයේ ප්‍රධානතම කාර්යභාරය වන කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ දෙවන භාෂා ප්‍රවීණතාව සපුරාලීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 ප්‍රකාරව දෙවන භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම අදාළ සියලු කටයුතු මෙම අංශය මගින් සිදු වේ. ඒ යටතේ පාඨමාලා ඉල්ලීම් ලිපි ලැයිස්තුගත කිරීමේ සිට පාඨමාලාලාභීන්ට සහතිකපත් නිකුත් කිරීම හා ප්‍රතිඵල සනාථ කිරීම දක්වා වන සියලු සම්බන්ධීකරණ කාර්යයන් හා අධ්‍යයන කාර්යයන් මෙම අංශය මගින් සිදු කෙරේ.

එහිදී, පුහුණු අංශය මගින් ප්‍රධාන වශයෙන් රාජ්‍ය නිලධාරීන් සඳහා කාණ්ඩ තුනක් යටතේ දෙවන භාෂා පුහුණු පාඨමාලා සංවිධානය කෙරෙන අතර ඒ සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පහත පරිදිය.

1. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැය 200 දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලා පැවැත්වීම.
2. ද්විතීයික කාණ්ඩයේ රාජ්‍ය නිළධාරීන් සඳහා වන පැය 150 දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලා පැවැත්වීම.
3. ප්‍රාථමික කාණ්ඩයේ නිලධාරීන් සඳහා පැය 100 දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලා පැවැත්වීම.

ඉහත සියලුම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මෙන්ම එම කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රමවේද යොදමින් පුහුණු පාඨමාලා සම්බන්ධ විධිමත් අධීක්ෂණයක් හා නියාමනයක් පවත්වා ගෙන යාමද මෙම අංශයේ කාර්යභාරයට අයත් වේ. එසේම සම්පත්දායක සංචිතය යාවත්කාලීන කර පවත්වා ගෙන යමින් එම සම්පත්දායකයන් නියමිත පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ තවත් කාර්යභාරයකි.

එසේම ආයතනික අරමුණු වඩාත් ඵලදායි අයුරින් සාක්ෂාත් කර ගනු වස් පුහුණු අංශය සඳහා පහත සඳහන් කාර්යන්ද පවරා ඇත.

1. රාජ්‍ය නිලධාරීන් සඳහා අර්ධකාලීන පාඨමාලා පැවැත්වීම.

2. ගුරු පුහුණු පාඨමාලා පැවැත්වීම.

3.පසු විපරම් හා නියාමන වැඩසටහන් සංවිධානය කිරීම.

4. සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා විධිමත් ඇගයීම් පැවැත්වීම.

මීට අමතරව ආයතනය මගින් පවත්වනු ලබන ආදායම් උත්පාදක පාඨමාලා දියත් කරනු ලබන්නේද පුහුණු අංශය මගිනි. ඒ යටතේ

1.දෙවන බස සිංහල හා දෙමළ ඩිප්ලොමා පාඨමාලා,

2.දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත් හා ඩිපලෝමා පාඨමාලා,

3.භාෂා පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව,

4.විශේෂ වෘත්තිකයන් සඳහා වන දෙවන භාෂා පාඨමාලා

5.ඉංග්‍රීසි භාෂා පාඨමාලා

6.විදේශීය භාෂා පාඨමාලා(හින්දි, ජපන්, කොරියන්, අරාබි)

7.සංඥා භාෂා පාඨමාලාව

මෙම පාඨමාලාවලට අදාළ සියලු කටයුතු පුහුණු අංශය මගින් සිදු කරනු ලබන අතර නව ලෝකයේ කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පුහුණු පාඨමාලා යාවත්කාලීන කරමින් සංවිධානය කිරීම කෙරෙහිද පුහුණු අංශය, නිරන්තයෙන් අවධානය යොමු කරයි.

ඒ අනුව, ශ්‍රී ලාංකේය සමාජය තුළ විවිධ භාෂා භාවිත කිරීමේ අයිතිය තහවුරු කිරීම අරමුණු කර ගනිමින් භාෂා විවිධත්වයකින් යුතු ජාතින් අතර සාමය සහ සහජීවනය වර්ධනය වන ආකාරයෙන් සාම්ප්‍රදායික දෙවන භාෂ පාඨමාලා රටාවෙන් විතැන්ව හෘදයාංගමව බැඳුණු, සෞන්දර්යාත්මක ප්‍රවේශයක් ඔස්සේ ප්‍රායෝගික භාෂා භාවිතය හා සංහිඳියාත්මක ආකල්ප ප්‍රවර්ධනය කෙරෙන ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ පාඨමාලා ලබා දීමට පුහුණු අංශය නිරන්තරයෙන් කටයුතු කරයි.

7.2.1 මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය **100** දෙවන භාෂා පුහුණුපාඨමාලා				
අනුඅංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන් ගණන	පාඨමාලාලාභීන් ගණන	වියදම රු
1	අනුරාධපුර දිස්ත්‍රික්කය	1	90	118,840.00
2	පොලොන්නරුව දිස්තික්කය	0	0	-
3	මහනුවර දිස්ත්‍රික්කය	0	0	-

4	මාතලේ දිස්තික්කය	2	68	163,440.00
5	නුවරඑලිය දිස්ත්‍රික්කය	0	0	-
6	කුරුනැගල දිස්ත්‍රික්කය	1	50	118,203.00
7	පුත්තලම දිස්ත්‍රික්කය	0	0	-
8	අම්පාර දිස්තික්කය	0	0	-
9	මඩකලපුව දිස්තික්කය	0	0	-
10	ත්‍රිකුණාමලය දිස්තික්කය	0	0	-
11	බදුල්ල දිස්ත්‍රික්කය	1	50	72,100.00
12	මොනරාගල දිස්ත්‍රික්කය	0	0	-
13	රත්නපුර දිස්ත්‍රික්කය	2	90	189,870.00
14	කෑගල්ල දිස්ත්‍රික්කය	0	0	-
15	යාපනය දිස්ත්‍රික්කය	0	0	-
16	කිලිනොච්චිය දිස්ත්‍රික්කය	3	120	234,330.00
17	මන්නාරම් දිස්ත්‍රික්කය	0	0	-
18	වව්නියාව දිස්ත්‍රික්කය	0	0	-
19	මුලතිව් දිස්ත්‍රික්කය	0	0	-
20	කොළඹ දිස්ත්‍රික්කය	0	0	-
21	කළුතර දිස්ත්‍රික්කය	1	60	85,944.00
22	ගම්පහ දිස්ත්‍රික්කය	0	0	-
23	මාතර දිස්ත්‍රික්කය	0	0	-
24	හම්බන්තොට දිස්ත්‍රික්කය	0	0	-
25	ගාල්ල දිස්ත්‍රික්කය	0	0	-
	එකතුව	**11**	**528**	**982,727.00**

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය 150 දෙවන භාෂා පුහුණුපාඨමාලා				
අනුඅංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන්ගණන	පාඨමාලාලාභීන් ගණන	වියදම රු
1	අනුරාධපුර දිස්ත්‍රික්කය	18	1228	2,457,121.00
2	පොලොන්නරුව දිස්ත්‍රික්කය	7	386	727,258.00
3	මහනුවර දිස්ත්‍රික්කය	12	575	1,387,751.00
4	මාතලේ දිස්ත්‍රික්කය	3	150	348,722.00
5	නුවරඑළිය දිස්ත්‍රික්කය	0	0	-
6	කුරුණෑගල දිස්ත්‍රික්කය	25	1413	3,158,405.00
7	පුත්තලම දිස්ත්‍රික්කය	5	298	638,403.00
8	අම්පාර දිස්ත්‍රික්කය	4	182	413,776.00
9	මඩකලපුව දිස්ත්‍රික්කය	5	277	510,284.00
10	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	0	0	-
11	බදුල්ල දිස්ත්‍රික්කය	10	493	1,092,962.00
12	මොනරාගල දිස්ත්‍රික්කය	8	641	1,289,740.00
13	රත්නපුර දිස්ත්‍රික්කය	14	769	1,475,794.00
14	කෑගල්ල දිස්ත්‍රික්කය	7	396	748,462.00
15	යාපනය දිස්ත්‍රික්කය	17	963	1,689,653.00
16	කිලිනොච්චිය දිස්ත්‍රික්කය	6	235	753,798.00
17	මන්නාරම් දිස්ත්‍රික්කය	2	131	184,740.00
18	වව්නියාව දිස්ත්‍රික්කය	5	261	595,468.00
19	මුලතිව් දිස්ත්‍රික්කය	6	328	566,608.00
20	කොළඹ දිස්ත්‍රික්කය	8	452	1,138,961.00
21	කළුතර දිස්ත්‍රික්කය	13	655	1,588,156.50
22	ගම්පහ දිස්ත්‍රික්කය	10	732	1,196,101.75

23	මාතර දිස්ත්‍රික්කය	3	145	795,391.00
24	හම්බන්තොට දිස්ත්‍රික්කය	4	170	581,990.00
25	ගාල්ල දිස්ත්‍රික්කය	5	260	678,912.00
	එකතුව	**197**	**11140**	**24,018,457.25**

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය 200 දෙවන භාෂා පුහුණුපාඨමාලා				
අනුඅංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන්ගණන	පාඨමාලාලාභීන් ගණන	වියදම රු
1	අනුරාධපුර දිස්ත්‍රික්කය	2	140	359,230.00
2	පොලොන්නරුව දිස්ත්‍රික්කය	2	98	234,190.00
3	මහනුවර දිස්ත්‍රික්කය	4	168	515,690.00
4	මාතලේ දිස්ත්‍රික්කය	1	50	162,315.00
5	නුවරඑලිය දිස්ත්‍රික්කය	1	50	262,430.00
6	කුරුණෑගල දිස්ත්‍රික්කය	3	178	489,505.00
7	පුත්තලම දිස්ත්‍රික්කය	1	59	90,765.00
8	අම්පාර දිස්ත්‍රික්කය	1	48	185,420.00
9	මඩකලපුව දිස්තික්කය	0	0	-
10	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	3	107	472,390.00
11	බදුල්ල දිස්ත්‍රික්කය	1	196	188,180.00
12	මොනරාගල දිස්ත්‍රික්කය	1	78	131,120.00
13	රත්නපුර දිස්ත්‍රික්කය	2	81	392,193.00
14	කෑගල්ල දිස්ත්‍රික්කය	1	32	200,396.00
15	යාපනය දිස්ත්‍රික්කය	1	35	213,100.00
16	කිලිනොච්චිය දිස්ත්‍රික්කය	0	0	-
17	මන්නාරම් දිස්ත්‍රික්කය	0	0	-
18	වව්නියාව දිස්ත්‍රික්කය	0	0	-

19	මූලතිව් දිස්ත්‍රික්කය	0	0	-
20	කොළඹ දිස්ත්‍රි ක්කය	11	481	1,510,642.52
21	කළුතර දිස්ත්‍රික්කය	2	131	240,320.00
22	ගම්පහ දිස්ත්‍රික්කය	3	152	478,110.00
23	මාතර දිස්ත්‍රික්කය	2	74	547,754.00
24	හම්බන්තොට දිස්ත්‍රික්කය	3	117	598,180.00
25	ගාල්ල දිස්ත්‍රික්කය	1	44	803,300.00
	එකතුව	**46**	**2319**	**8,075,230.52**

1.3 ආදායම්උත්පාදිත වැඩසටහන් - 2021

ආදායම් උත්පාදිත වැඩසටහන් - **2021**					
(01/01/2021 - 31/12/2021)					
අනුඅංකය	**පාඨමාලා වර්ගය**	**පාඨමාලා ගණන**	**පාඨමාලාලාභීන් ගණන**	**අයවැය රු.**	
				ආදායම් රු.	**ලාභය රු.**
ආදායම් උත්පාදිත වැඩසටහන් - මාකුඹුර ප්‍රධාන කාර්යාලය මගින් ආරම්භ කරන ලද					
1	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 100 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	0	0	-	-
2	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 150 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	5	281	2,810,000.00	2,245,700.00
3	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 200 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	4	179	5,495,000.00	3,971,806.00
	එකතුව	**9**	**460**	**8,305,000.00**	**6,217,506.00**

අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය මගින් මෙහෙය වන ලද ආදායම් උත්පාදිත වැඩසටහන්					
1	රාජ්‍ය නිලධාරීන්උදෙසා වන දින 11 නේවාසික දෙවන භාෂා පුහුණු වැඩසටහන	5	194	4,825,000.00	2,281,663.00
2	රාජ්‍ය නිලධාරීන්උදෙසා වන දින 12 නේවාසික දෙවන භාෂාපුහුණු වැඩසටහන	2	69	1,725,000.00	496,528.00
	එකතුව	**7**	**263**	**6,550,000.00**	**2,778,191.00**
දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය මගින් මෙහෙයවන ලද ආදායම් උත්පාදිත පුහුණු වැඩසටහන්					
	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 100 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	0	0	0	0
	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 150 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	10	399	3,930,000.00	2,912,316.59
	රාජ්‍ය නිලධාරීන් උදෙසා වන පැය 200 දෙවන භාෂා පුහුණු පාඨමාලාව	2	70	1,095,000.00	793,089.50
	එකතුව	**12**	**469**	**5,025,000.00**	**3,705,406.09**

1.4 පසු විපරම් හා නියාමන වැඩසටහන් - 2021

පසු විපරම් හා නියාමන වැඩසටහන් - **2021**						
අනුඅංකය	**පාඨමාලාවේ නම**	**පවත්වන ලද ස්ථානය**	**ආරම්භක දිනය**	**අවසාන දිනය**	**පාඨමාලා ලාභීන් ගණන**	**වියදම**
1	පසු විපරම් හා නියාමන වැඩසටහ- 01	බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2021.02.23	2021.02.23	59	63,945.00
2	පසු විපරම් හා නියාමන වැඩසටහ- 02	යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2021.03.16	2021.03.16	65	66,840.00
3	පසු විපරම් හා නියාමන වැඩසටහ- 03	අගලවත්ත පුහුණු ආයතනය	2021.04.05	2021.04.09	31	130,300.00
4	පසු විපරම් හා නියාමන වැඩසටහ- 04	ජාතිය ගොඩනගන්නන්ගේ සංගමය - කුණ්ඩසාලේ	2021.04.21	2021.04.21	60	35,500.00

1.5 දෙවන භාෂා ගුරුපුහුණු වැඩසටහන් - 2021

1.5 සහතික පත්‍ර පාඨමාලා පිලිබඳ විස්තරය

සංඥා භාෂා සහතික පත්‍ර පුහුණු පාඨමාලාව - **2021**			
පැවැත්වූ ස්ථානය	ආරම්භක දිනය	**පාඨමාලා ලාභීන් ගණන**	**මුළුආදායම**
මාර්ගගතව - **zoom** තාක්ෂණය ඔස්සේ	20.12.2021	34	1,020,000.00

පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සඳහා වූ ඉංග්‍රීසිභාෂා පුහුණු පාඨමාලාව **2021**		
පැවැත්වූ ස්ථානය	ආරම්භක දිනය	**පාඨමාලාලාභීන් ගණන**
පාර්ලිමේන්තු සංකීර්ණය	15.12.2021	14

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව**2021**		
පැවැත්වූ ස්ථානය	ආරම්භක දිනය	**පාඨමාලාලාභීන් ගණන**
පැය 100 ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව	29.12.202**1**	120
පැය 150 ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව	29.12.202**1**	38
පැය 200 ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව	29.12.202**1**	40
එකතුව		198

1.6 විවිධ ව්‍යාපෘති හා සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ආයතනය	**පාඨමාලාව**	**පාඨමාලා ගණන**	**පාඨමාලා ලාභීන් ගණන**
එන්ලීප් ආයතනය	ගුරු පුහුණු වැඩසටහන්	12	487
බ්‍රිතාන්‍ය කවුන්සිලය	සම්පත්දායකයින්සඳහා වූ zoom තාක්ෂණය පිලිබඳ පුහුණු සැසි-	04	39
බ්‍රිතාන්‍ය කවුන්සිලය	සම්පත්දායකයින් සඳහා වූ TLT ක්‍රමවේදය පුහුණු කිරීමේ මාර්ගගත සැසි	06	154
බ්‍රිතාන්‍ය කවුන්සිලය	රාජ්‍ය නිලධාරීන් සඳහා වූ භාෂා පරිවර්තක හා පරිවර්තන පුහුණු සැසිය - 2021	08	139
බ්‍රිතාන්‍ය කවුන්සිලය	රාජ්‍ය **නිලධාරීන් සඳහා වූ ප්‍රායෝගික දෙමළ පුහුණු සැසි(PTPS) – 2021**	50	893
	එකතුව	**80**	**1712**

7.3 සැලසුම් අංශය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ සඳහන් අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව සංයුක්ත සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ මාසික සැලසුම් සකස් කිරීම, ගිණුම් අංශය සමඟ සම්බන්ධ වී මාසිකව අවශ්‍ය මුදල් අවශ්‍යතා ලබා ගැනීමට කටයුතු කිරීම, මාසිකව, ත්‍රෛමාසිකව, සහ වාර්ෂිකව ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර අදාළ අංශ වෙත යොමු කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. එසේම මෙම අංශය මඟින් විවිධ ව්‍යාපෘ
ති මඟින් සිදු කෙරෙන වැඩසටහන්වලට අදාළ සැලසුම් සකස් කිරීමත් ඒවායේ ප්‍රගති වාර්තා සකස් කිරීමත් සිදුවේ.

7.3.1 දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය

උගත් පාඩම් පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශයන්ට අනුව, දෙවන බස (සිංහල/ දෙමළ) හා සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි සහ අනෙකුත් විදේශ භාෂා ඉගැන්වීම සඳහා ප්‍රාදේශීය වශයෙන් පහසුකම් සැලසීමේ අරමුණින් අංක 734/1, අනුරාධපුර පාර, දඹුල්ල යන ස්ථානයෙහි ස්ථාපිත කරන ලද මෙම මධ්‍යස්ථානය 2022.07.24 දින රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදි. වර්ග අඩි 2475ක වර්ග ප්‍රමාණයකින් යුත් මෙම මධ්‍යස්ථානය දේශන ශාලාවක්, කාර්යාලයක් සහ කෑම කාමරයකින් යුක්ත වේ. දැනට මෙම මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) අධීක්ෂණය යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් තිදෙනෙකු, කාර්යාල කාර්යය සහයක නිලධාරීන් දෙදෙනෙකු සහ එක් රියදුරු මහතෙකු සේවය කරනු ලබයි.

මාතලේ, මහනුවර, කුරුණෑගල, අනුරාධපුර, පොලොන්නරුව, යන දිස්ත්‍රික්ක වලට කේන්ද්‍රගතව පිහිටා ඇති මෙම මධ්‍යස්ථානය මඟින් ඉහත දිස්ත්‍රික්ක ඇතුළුව දිවයින පුරා රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් ප්‍රජාව වෙනුවෙන් කාර්යක්ෂමව හා විධිමත් ලෙස භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා වී ඇත.

2020 වර්ෂයේ සිට රට තුළ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙම මධ්‍යස්ථානය මඟින් ඉටුකිරීමට අපේක්ෂා කරන ලද ඉලක්කයන් සපුරාගැනීමට බාධා ඇති වුවද 2021 වර්ෂය තුළදී ඉහත අභියෝග හමුවේ යම් කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකියාව ලැබීම සාධනීය තත්වයකි.

<u>දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද ආදායම් උත්පාදිත වැඩසටහන්.</u>

සම්පූර්ණ කරන ලද වැඩසටහන්

පැය 150 සිංහල/ දෙමළ භාෂා පුහුණු පාඨමාලා

අනු. අංක	පාඨමාලාව	ස්ථානය	කාලසීමාව	පාඨමාලා ලාභීන් ගණන	අදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
1	යටවත්ත කලාපයේ ගුරුවරුන් සඳහා වන පැය150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	යටවත්ත ජාතික පාසැල - මාර්ගගතව	2021.10.21 - 2021.11.18	58	150,000	138,465	11,534
2	රාජ්‍ය නිලධාරීන් සඳහා වන පැය150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.11.25 - 2021.12.19	35	350,000	136,791	213,209
3	පාසල් ගුරුවරුන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.11.30 - 2021.12.23	53	530,000	137,509	392,491
4	පාසල් ගුරුවරුන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	මැදිරිගිරිය ජාතික පාසැල	2021.12.05 - 2021.12.30	40	340,000	190,434	149,566
	එකතුව			**186**	**1,370,000**	**603,199**	**766,800**
	පැය 200 සිංහල/ දෙමළ භාෂා පුහුණු පාඨමාලා.						
1	පරිපාලන සේවා නිලධාරීන් සඳහා වන පැය 200 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	දඹුල්ල ප්‍රාදේශීයපුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.10.26 - 2021.12.30	38	585,000	153,538	431,462
2	නැගෙනහිර පළාත් පරිපාලන සේවා නිලධාරීන් සඳහා වන පැය 200 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.11.05 - 2021.12.12	32	510,000	148,373	361,627
	එකතුව			**70**	**1,095,000**	**301,910**	**793,090**
	මුළු එකතුව		-	**256**	**2,465,000**	**923,996**	**1,541,004**

2021.12.31 දිනට ක්‍රියාත්මක වෙමින් පැවති වැඩසටහන් **පැය 150 සිංහල/ දෙමළ භාෂා පුහුණු පාඨමාලා**

අනු. අංක	පාඨමාලාව	ස්ථානය	ආරම්භක දිනය	පාඨමාලා ලාභීන් ගණන	අදායම (රු.)
1	මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා නිලධාරීන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව.	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.12.16	38	380,000
2	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව. (කණ්ඩායම - 01)	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.12.18	50	-
3	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව.(කණ්ඩායම - 02)	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.12.19	48	-
4	නාඋල පාසල් ගුරුවරුන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව.	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.12.27	37	180,000
5	මැදිරිගිරියකලාපයේ පාසල් ගුරුවරුන් සඳහා වන පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව.	දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - මාර්ගගතව	2021.12.05	37	185,000
	එකතුව			**210**	**745,000**

❖ අංක 1 යටතේ ඇති පාඨමාලාව මහ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත නොමිලේ පැවැත්වීමට සැලසුම් කර තිබුනද එම මුදල නොලැබීම මත පාඨමාලාවේ ඉදිරි කටයුතු සිදු කර ගැනීමට නොහැකි විය. එබැවින් එම පාඨමාලවට දැරීමට සිදුවන වියදම් පමණක් ආවරණය වන පරිදි ගාස්තු අයකර පාඨමාලා ලාභීන්ගේ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන ලදී. අනෙකුත් පැය: 150ක පාඨමාලා සඳහා රු.10,000.00 බැගින් ගාස්තු අයකර ක්‍රියාත්මක කර ඇත.

7.4 ගිණුම් අංශය

ආයතනයේ සියලුම මුල්‍ය පාලන සහ ගිණුම් කටයුතු සිදු කිරීම ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ආයතනයේ ප්‍රධාන මුල්‍ය විධායකයා අධ්‍යක්ෂ ජනරාල් වන අතර ගණකාධිකාරී විසින් මුල්‍ය කටයුතු හා ගිණුම් කටයුතු පිළිබඳ වගකීම දරනු ලබයි.

ගිණුම් අංශයේ කාර්යයන්

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට හා ගණන්දීමේ නිලධාරී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට මුල්‍ය බැඳීම ඉටු කරලීමට සහ පාර්ලිමේතුව වෙත වගවීම දැරීමට සහාය වීම.

- රජයේ මුල්‍ය නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.
- මුල්‍ය කළමනාකරණය ගිණුම්කරණ පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම.
- අයවැය පුරෝකථනය/ මුල්‍ය සැලසුම් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
- කාලීන හා නිවැරදි මුල්‍ය වාර්තා පවත්වාගෙන යාම.
- වර්ෂ අවසාන ගිණුම් සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
- බදු ප්‍රතිපත්තිවලට හා අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම.
- නිසි වේලාවට සේවක වැටුප් හා වේතන ගෙවීම
- ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවල මුල්‍ය කටයුතු මෙහෙය වීම හා අවශ්‍ය මුල්‍ය පහසුකම් සම්පාදනය කර දීම.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1) ආයතනික තොරතුරු

1.1 පිහිටීම සහ නෛතික රාමුව.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය 2007 අංක 26 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. එහි පුහුණු මධ්‍යස්ථානය ගලේවත්ත, අගලවත්ත යන ලිපිනයේ පිහිටා ඇත.

2) ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලබන අතර සුදුසු පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත.

2.2. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර අවබෝධ කර ගැනීමට අදාළව අවශ්‍ය වන පෙර වර්ෂවල සංසන්දනාත්මක තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල ඇති දෑ ඉදිරිපත් කිරීමට හෝ නැවත සංශෝධනය කිරීමට ඇති විට ප්‍රවර්ධන වර්ෂය සමග තහවුරු කිරීම සඳහා සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කර ඇත.

2.3. දේපළ, පිරියත, හා උපකරණ

දේපළ, පිරියත, හා යන්ත්‍රෝපකරණවල අගය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය වටිනාකම් අඩුකළ පසු අගයෙන්, වඩා අඩු අගයකට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මෙම වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම්, ඒවායේ ඵලදායී ජීවකාලය තුළ සමානුපාතිකව බෙදීයන පරිදි පහත සඳහන් ක්ෂය අනුපාත මත ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

	අනුපාතය (%)
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2.5
ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	10
පුස්තකාල පොත්	10
යන්ත්‍ර සූත්‍ර, පිරියත හා උපකරණ	20
වාහන	25
පරිගණක	25
වෙබ් අඩවිය	25

2014 වර්ෂය දක්වා අදාළ වත්කම් මිලදී ගත් වර්ෂයේදී එම සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය වෙන් කරන එම වත්කම් ඉවත් කිරීමේදී ඉවත් කරන සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන් කිරීම සිදු නොකරනු ලබයි. 2014 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් මිලදී ගත් / ඉවත් කළ දිනය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

2.4 පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවකයකු සේවයට බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම සේවා භවතුන්ගේ පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබාගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂික මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයත් සම්පූර්ණ කළ සේවකයකු සේවයෙන් ඉවත්වීමේදීය.

2.5 ලැබිය යුතු ශේෂ

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්දි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ 90 අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණය ගැනි ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම කරනු ලබයි.

2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැම්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරයි.

2.7 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු සිදුවී ඇති සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවල අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

2.8 බැරකම් වෙනුවෙන් වෙන් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කරන දින වන විට නිශ්චිතව ගණනය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

2.9 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන් කිරීම.

සේවක භවතුන්හට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

2.10 ආදායම

2.10.1 පුනරාවර්ථන ආදායම ලෙස ලැබෙන රාජ්‍ය ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

2.10.2 ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

2.11 වියදම්

ආයතනයේ දෛනික කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්ථන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

2.12 තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

3) මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්

3.1 ක්ෂය ප්‍රතිපත්ති

2014 වර්ෂය දක්වා ක්ෂය කිරීමේදී අනුගමනය කළ මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන්කිරීමේ හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී එම ඉවත් කරන සම්පූර්ණ වර්ෂයටම ක්ෂය වෙන් නොකිරීමේ ප්‍රතිපත්තිය 2014 වර්ෂයෙන් පසු අදාළ වත්කම් මිලට ගත් දිනය හෝ ඉවත් කළ දිනය සලකා ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය දක්වා වෙනස් කර ඇත.

4) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී "වක්‍ර ක්‍රමය" අනුගමනය කරන අතර මුදල් හා මුදල් සමාන දෑ තුළ බැංකු ශේෂ / අයිරා වටිනාකම්ද ඇතුළත් කර ඇත.

2021/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

		2021	2020
	සටහන	රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියිත සහ උපකරණ	06	41,066,102	47,994,529
ජංගම වත්කම්			
වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ	07	9,949,531	15,088,531
තොග - ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන භාණ්ඩ		1,575,782	1,638,812
මුදල් හා මුදල් සමාන දෑ	08	75,236,348	72,255,819
මුළු වත්කම්		127,827,763	136,977,691
අරමුදල්, සංචිත සහ බැරකම්			
ප්‍රාග්ධනය		13,015,468	13,015,468
සමුච්චිත අතිරික්ත (හිඟය)		40,503,368	57,135,277
ප්‍රත්‍යාගණන සංචිත		47,000,892	47,000,892
		100,597,600	117,151,637
ජංගම නොවන බැරකම්	09		
පාරිතෝෂික වෙන් කිරීම		5,529,673	4,675,348
ස්ථාවර වත්කම් සඳහා රජයේ ප්‍රදාන		791,272	-
		6,320,945	4,675,348
ජංගම බැරකම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු වටිනාකම්	10	19,165,476	13,524,317

උපචිත වියදම්	11	1,821,614	1,626,389
		20,987,091	15,150,706
මුළු අරමුදල් සහ බැරකම්		127,827,763	136,977,691

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් ලෙස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දින වනවිට සහ එහි ගෙවී ගිය වර්ෂය සඳහා වූ අතිරික්තය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බව සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීති-රෙගුලාසිවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

ගණකාධිකාරි අධ්‍යක්ෂ ජනරාල්

අංක 1 සිට 3 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් වන අංක 8 සිට 12 දක්වා පිටුවල ඇතුළත් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලම කොටසක් වේ. කළමණාකරණ මණ්ඩය මෙම ගිණුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම් දරන අතර මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකරණ මණ්ඩලය අනුමැතිය ලැබී ඇත.

සභාපති කළමනාකරණ මණ්ඩල සාමාජික

2021/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
ආදායම්			
භාණ්ඩාගාර ප්‍රදාන	01	78,283,909	69,281,000
පුහුණු වැඩසටහන් වල ආදායම.		22,732,875	16,382,450
වෙනත් ආදායම්	02	2,383,237	2,469,923
		103,401,021	88,133,373
වියදම්			
පරිපාලන වියදම්	03	(77,188,762)	(69,896,731)
පුහුණු වැඩසටහන් සඳහා වියදම්	04	(40,055,155)	(10,274,234)
මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය)		(13,833,896)	7,962,408
මූල්‍ය වියදම්	05	(15,540)	(15,540)
බදු පෙර අතිරික්තය/(හිඟය)		(13,849,346)	7,946,868
බදු		-	-
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)		(13,849,346)	7,946,868

2021/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය/(හිඟය)	ප්‍රත්‍යා ගණන සංචිත	එකතුව
2020/01/01 දිනට ශේෂය	13,015,468	43,096,339	47,000,892	103,112,700
පෙර වර්ෂයේ ගැලපුම්	-	6,092,070	-	6,092,070
වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)	-	7,946,868	-	7,946,868
2020/12/31 දිනට ශේෂය	13,015,468	57,135,277	47,000,892	117,151,638
පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 12)	-	(2,782,563)	-	(2,782,563)
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	-	(13,849,346)	-	(13,849,346)
2021/12/31 දිනට ශේෂය	**13,015,468**	**40,503,368**	**47,000,892**	**100,519,729**

2021/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021	2020
	රු.	රු.
බදු පෙර අතිරික්තය/(හිඟය)	**(13,849,346)**	7,946,868
මූල්‍යමය නොවන සංචලන සඳහා වන ගැලපුම්		
ක්ෂය	**7,662,017**	10,365,424
පෙර වර්ෂයේ ගැලපුම්	**(2,782,563)**	6,092,070
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම්	**854,325**	1,251,155
	(8,115,568)	25,655,517
අඩු කළා :		
පොලි ආදායම	**(1,892,001)**	(2,217,173)
පාරිතෝෂික ගෙවීම්	**(-)**	(287,900)
කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	**(10,007,568)**	23,150,444
කාරක ප්‍රාග්ධන විචලන		
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු වටිනාකම්වල වැඩිවීම්/අඩුවීම්	**5,139,000**	(3,917,500)
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු වටිනාකම්වල වැඩිවීම්/අඩුවීම්	**5,836,384**	(4,915,497)
තොග අඩුවීම්/වැඩිවීම්	**63,030**	(368,057)
	1,030,845	13,949,389
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,030,845**	13,949,389

ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය

දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	**(733,590)**	(89,000)
පොලි ආදායම	**1,892,000**	2,217,173
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ ලාභය	**1,158,410**	2,128,173
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ ප්‍රවාහ		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රවාහ	**791,272**	-
මූල්‍යමය කටයුතු වලින් ලද ශුද්ධ ප්‍රවාහ	**791,272**	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ප්‍රවාහය	**2,980,528**	16,077,662
වර්ෂය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	**72,255,819**	56,178,157
වර්ෂය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ(සටහන අ)	**75,236,348**	72,255,819

සටහන අ - මුදල් හා මුදල් සමාන දෑ

	රු.	රු.
බැංකුවේ ඇති මුදල්	**75,236,348**	72,255,819
	75,236,348	72,255,819

2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සඳහා වන සටහන්

සටහන 01 - ආදායම්		2021	2020
		රු.	රු.
පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදාන		53,027,500	61,181,000
ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රදාන			
භාණ්ඩාගාරයෙන් ලැබීම්	(26,000,000)		8,100,000
ස්ථාවර වත්කම් වලින් ලද ප්‍රදාන	(733,591)	25,266,409	
		78,293,909	69,281,000
පුහුණු වැඩසටහන් ආදායම්		22,732,875	16,382,450
වෙනත් ආදායම්			
ටෙන්ඩර් ගාස්තු		145,000	45,000
පොලී ආදායම්		1,892,001	2,217,173
වැටුප් රහිත නිවාඩු හා වැටුපෙන් අඩුකිරීම්		-	64,175
ස්ථාවර වත්තම් සඳහා රජයේ ප්‍රධාන		29,081	-
වෙනත් ආදායම්		317,156	143,575
		2,383,237	2,469,923

සටහන 03 - පරිපාලන වියදම්

සේවක වේතන

වැටුප් සහ වේතන	22,469,833	20,014,086
සේ.අ.අ. දායකය 12%	2,681,990	2,401,690

සේ.භා.අ.දායකය 3%	670,497	600,423
අතිකාල	265,641	52,286
නිවාඩු දින දීමනා	5,661,	26,062
වෙනත් දීමනා	501,460	559,438
වාහන දීමනා	1,800,000	1,627,586
ඉන්ධන දීමනා	739,705	638,662
පුහුණුවන්නන් සඳහා වන දීමනා	361,000	223,250
සහභාගීත්ව සහ ප්‍රවාහන දීමනා	85,000	
සභාපති දීමනා	637,500	775,862
දිරි දීමනා	630,000	-
පාරිතෝෂික වියදම්	854,325	1,251,155
ප්‍රවාහන - දේශීය	435,399	479,348
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	1,444,697	553,868
ඉන්ධන දීමනා	1,029,563	417,706
නිල ඇඳුම්	28,000	24,000
සංග්‍රහ වියදම්	333,589	90,333
පුවත්පත් සහ වෙනත්	41,718	-

නඩත්තු වියදම්

වාහන	1,544,310	544,304
පිරියත සහ යන්ත්‍රෝපකරණ	527,316	358,348

පරිගණක	185,181	57,630
ගොඩනැගිලි	276,845	263,294
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	38,595	24,048
සේවා		
තැපැල් සහ සන්නිවේදන	840,705	947,348
විදුලිය	1,353,253	358,348
ජලය	136,976	132,634
කුලිය	17,323,695	16,200,000
ප්‍රවාහනය	34,183	95,671
ආරක්ෂක සේවා	3,619,667	2,478,860
පවිත්‍රතා සේවා සහ සහායක කාර්ය මණ්ඩල වියදම්	3,794,391	2,879,416
වෙළෙඳ දැන්වීම්	101,223	101,088
සතීපාරක්ෂක වියදම්	240,001	522,404
මෙහෙයුම් කල්බදු	3,557,518	3,557,495
විගණන ගාස්තු	330,000	360,000
පරිවර්තන ගාස්තු	71,225	-
නීතිඥ ගාස්තු හා මුද්දර ගාස්තු	300,000	
කාර්යක්ෂමතා කඩයිම් විභාග ගාස්තු	186,478	-
වෙනත්	49,606	198,853
ක්ෂය		
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	648,569	648,569
පිරියිත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	50,929	2,692,409
ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	1,927,016	1,919,517
වාහන	4,950,000	4,950,000
වෙබ් අඩවි	19,428	-
පරිගණක	66,076	154,929
	77,188,762	69,896,731

සටහන 04- පුහුණු වැඩසටහන් සඳහා වන වියදම්

	2021	2020
සම්පත් දායක දීමනා	30,828,819	2,151,402
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	1,430,444	452,321
තැපැල් සහ සන්නිවේදන	547,456	354,886
ආහාරපාන සහ සංග්‍රහ වියදම්	2,336,397	1,611,001
නවාතැන්	216,695	116,800
වැඩසටහන් පරිපාලන සහ සම්බන්ධීකරණ ගාස්තු	-	36,000
ගුරු අත්පොත් සහ පෙළ පොත්	50,000	240,000
සහතිකපත්‍ර සහ අත්පොත් මුද්‍රණ ගාස්තු	210,800	1,325,045
සහාය කාර්ය මණ්ඩල සේවා	45,928	-
අතිකාල	692,011	316,451
නිවාඩු දින ගෙවීම්	268,531	78,889
ඉන්ධන	690,507	400,919
විදුලිය	37,934	396,417
ජලය	119,131	158,731
ප්‍රවාහන - දේශීය	327,210	238,544
පුහුණු හා තාවකාලික කාර්ය මණ්ඩල දීමනා	1,782,029	1,616,921
වාහන නඩත්තු	-	2,850
පරිගණක නඩත්තු	-	1300
නඩත්තු පිරියත හා යන්ත්‍රෝපකරණ	-	68,945
ගොඩනැගිලි නඩත්තු	-	24,240

කාර්යාලීය උපකරණ නඩත්තු	-	320
ප්‍රවාහන සහ සහභාගීත්ව දීමනා	46,600	-
වෙළෙඳ දැන්වීම්	12,500	48,276
නේවාසිකාගාර සහ කාර්යාලීය අවශ්‍යතා	146,240	87,276
කුලී සහ දේශනශාලා ගාස්තු	-	412,305
පරිවර්තන, විභාග සහ උපදේශන ගාස්තු	37,953	-
සනීපාරක්ෂක ගාස්තු	227,350	--
වෙනත් සේවා	620	134,603
	40,055,065	10,274,234

සටහන 05 - මූල්‍ය වියදම්

බැංකු ගාස්තු	**15,450**	**15,540**
	15,450	**15,540**

සටහන 06 - දේපළ පිරියත හා උපකරණ

	ක්ෂය අනුපාතය	මුළු පිරිවැය 2021/01/01	වර්ෂය තුළ එකතු කිරීම්	**මුළු පිරිවැය 2021/12/31 දිනට**	සමුච්චිත ක්ෂය 2021/01/01 දිනට	වර්ෂය සඳහා ක්ෂය	**සමුච්චිත ක්ෂය 2021/12/31 දිනට**	**ලියා හල අගය 2021/12/31 දිනය**
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම	-	615,000	-	**615,000**	-	-	-	**615,000**
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.5%	25,942,745	-	25,942,745	2,331,460	648,569	**2,980,028**	**22,962,717**
පිරියිත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	20%	13,462,046	29,410	**13,491,456**	13,322,481	50,929	**13,373,410**	**118,046**
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	10%	19,173,793	239,181	-	9,804,549	1,927,016	**11,731,565**	7,770,309
වාහන	25%	19,800,000	-	**19,800,000**	6,536,712	4,950,000	**11,486,712**	8,313,288
පුස්තකාල පොත්	10%	1,343,352	-	**1,343,352**	1,343,352	-	**1,343,352**	-
පරිගණක	25%	8,316,944	-	**8,316,944**	8,119,867	66,076	**8,185,943**	131,001
NILET වෙබ් අඩවිය	25%	-	465,000	**465,000**	-	19,428	**19,428**	445,572
		88.742.780	733,590	**89,476,371**	41,458,420	7,662,017	**49,120,438**	40,355,931
කෙරීගෙන යන ගොඩනැගිලි හා බෙදා වෙන් කිරීම්								710,171
මුළු ලියා හල අගය								41,066,102

	2021	2020
සටහන 07 - වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ		
	රු.	රු.
ලැබිය යුතු ශේෂ - හේවාසිංහ මයා	58,983	58,983
ලැබිය යුතු ශේෂ - තුරම් මයා	17,163	17,163
ලැබිය යුතු ශේෂ - නාපාවල මිය	9,650	9,650
ලැබිය යුතු ශේෂ - වික්‍රමසිංහ මයා	9,650	9,650
වෙබ් අඩවිය සඳහා ගෙවා ඇති අත්තිකාරම්	-	93,000
උත්සව අත්තිකාරම්	104,000	
	275,000	-
ලැබිය යුතු වැඩසටහන් ආදායම් රාජ්‍ය සේවා අමාත්‍යාශය		
ලැබිය යුතු ආදායම් - ලංකා විදුලිබල මණ්ඩලය	-	900,000
තැන්පතු	161,500	161,500
ගොඩනැගිලි සඳහා තැන්පතු	6,519,500	6,519,500
ලැබිය යුතු ශේෂ - බුද්ධ ශාසන අමාත්‍යාංශය	165,000	165,000
ලැබිය යුතු ශේෂ - සෞඛ්‍ය අමාත්‍යාංශය	338,800	4,863,800
ලැබිය යුතු ශේෂ - රේඛීය අමාත්‍යාංශය	2,290,285	2,290,285
	9,949,531	15,088,531

සටහන 08 - මුදල් හා මුදල් සමාන දෑ

	රු.	රු.
ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 0007442918		
ප්‍රාග්ධන මුදල් පොත	758,102	1,465,131
පුනරාවර්තන මුදල් පොත	997,002	4,895,320
අමාත්‍යාංශ උත්පාදිත මුදල් පොත	270	270
ආදායම් උත්පාදිත මුදල් පොත	9,378,106	3,684,230
භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීම	6,150	6,150
ඉතිරිකිරීමේ ගිණුම -ලංකා බැංකුව- BOC 79712746	64,096,718	62,204,717
	75,236,348	72,255,819

සටහන 09- ජංගම නොවන වගකීම්

ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන		
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	791,272	-
	5,529,673	4,675,348
	6,320,945	4,675,348

සටහන 10 - වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු ශේෂ

	රු.	රු.
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	542,000	870,600
සම්පත්දායක දීමනා	13.,976,035	5,698,735
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය	-	274,250
වික්‍රමාරච්චි කන්ස්ට්‍රක්ෂන් - අගලවත්ත අළුත්වැඩියාව	637,946	637,946
ණය හිමියන්	-	324,000
ලීමා ක්‍රියේෂන් - අභ්‍යන්තර සැකසීම්	-	2,039,290
ගෙවිය යුතු විගණන ගාස්තු	1,050,000	720,000
ණය හිමියන් - රූපවාහිනි හා ගුවන් විදුලි වැඩසටහන්	2,959,496	2,959,496
	19,165,476	13,524,317

සටහන 11 - උපචිත වියදම්	2021	2020
	රු.	රු.
දේශීය ගමන් ගාස්තු	9,020	21,420
තැපැල් සහ සන්නිවේදන	126,884	145,145
විදුලි ගාස්තු	83,306	86,849
ජලය 2640		3,829
ඉන්ධන	-	

ආරක්ෂක සේවා	346,775	218,315
ආහාර සහ සංග්‍රහ	-	1,435
අතිකාල	206,175	15,000
නිවාඩු දින ගෙවීම්	59,995	11,183
අනියම් සහ පුහුණු දීමනා	52,500	256,823
පරිවර්තන ගාස්තු	37,953	-
ගෙවිය යුතු කුලී	-	27,305
සනීපාරක්ෂක සේවා	379,847	270,000
පෙළපොත් සහ ගුරු අත්පොත් පිළියෙල කිරීම	290,000	240,000
ගෙවිය යුතු ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ -	226,521	226,521
අනෙකුත් උපචිත වියදම්	-	53,292
	1,821,614	1,626,389

සටහන 12 - පෙර වර්ෂයේ ගැලපුම්	2021	2020
	රු.	රු.
2016 වර්ෂයේ ගෙවන ලද තැන්පතු	-	6,250,000
අභ්‍යන්තැ සැකසුම් සඳහා අධි වෙන් කිරීම්	(279,199)	-
අයවිය යුතු මුදල් සෞ.අමාත්‍යාංශය	2,975,000	-
පෙර වර්ෂයේ ආරක්ෂක බිල්පත්	-	(174,259)
වැඩ තහනම් වූ නිලධාරීන් සඳහා වන වෙන් කිරීම්	-	16,329
ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රදාන-2020	86,762	
	2,782,563	6,092,070

සටහන 13

ආයතනයේ සේවයෙන් පහකර ඇති පි.එම්.එම්. ෆිර්දාස් මහතා විසින් ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ගොනු කරන ලද අංක 33/1415/2019 දරන නඩුවක් මහරගම කම්කරු උසාවියේ පවතින අතර මේ වන තෙක් තීරණයක් ලැබී නොමැත.

එමෙන්ම සී.පි.පි. සිල්වා මහතා සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් හෝමාගම කම්කරු උසාවියේ අංක 33/1562/2021 යටතේ පවරා ඇති නඩුව සමථයකට පත් වී නොමැත.

තවද, ආයතනයේ වරලත් නියෝජිත ආයතනයක් ලෙස ලියාපදිංචි වී ඇති නීශා ටැමිල් ඇකඩමි ආයතනය 2019 වර්ෂයේ සිදු කළ භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට අදාළව එම ආයතනය රු. 446,485ක් ලැබිය යුතු යැයි දක්වමින්, මානව හිමිකම් කොමිෂන් සභාවේ සිදු කර ඇති පැමිණිල්ලකට අනුව පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

සටහන14

2019 අයවැය යෝජනා හා අමප/19/2693/131/018-I අනුමැතිය අනුව සිදුකළ භාෂා පුහුණුකරුවන් පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට අදාලව ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු.37,395,922 ක් වන අතර ඒ සඳහා අවශ්‍ය අර මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුය. දැනට මෙම වැඩසටහන 2019 දී අත්හිටුවා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/C/NILET/FS/01/21/22 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 අගෝස්තු 16 දින

සභාපති

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ)සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු. 14,712,522 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතියද එම වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ඇති වී තිබුණු වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර ද නොතිබුණි.

(ආ) පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් විසින් 2019 වර්ෂයේදී පවත්වන ලද පාඨමාලා 67 කට අදාලව ලැබිය යුතු පාඨමාලා ගාස්තුවෙන් සියයට 15 ක් වන රු. 3,381,714 ක ලැබිය යුතු මුදල්ද, එම ආයතනය විසින් මෙම ආයතනය වෙනුවෙන් පවත්වන ලද පාඨමාලාවක් සඳහා ගෙවිය යුතු වූ රු. 19,968,877 ක මුදල්ද සමාලෝචිත වර්ෂය තුල හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන්

සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතිරීති විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 6 ඡේදයේ (ඊ) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11ඡේදයේ (බී) වගන්තිය	2021 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.64,096,718ක ශේෂය කලමනාකරණ මණ්ඩලයේ හා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන්, මෙම මුදල් ආයෝජනය කිරීමකින් තොරව වර්ෂ කිහිපයක සිටම සාමාන්‍ය ඉතිරිකිරීම් ගිණුමක පවත්වාගෙන යාම හේතුවෙන් ආයෝජනය කර ලබා ගත හැකිව තිබූ ඉහළ පොළී ආදායම අහිමි වී ගොස් තිබුණි.
(ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) හා (3)	2021දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් විසින් තැන්පත් කරන ලද ආපසු ගෙවිය යුතු රු.542,000 වූ තැන්පතු ශේෂය තුල වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු වටිනාකම රු.117,000ක් විය. මෙම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2020 ඔක්තෝබර් 16 දිනැති අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.1 ඡේදය	පුහුණු පාඨමාලා පැවැත්වීමේ වගකීම රාජ්‍ය භාෂා විෂය භාර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා තිබුණද, චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව කලමනාකරණ තීරණයක් මත නිල භාෂා හා වෘත්තිය අධ්‍යාපන ආයතනය වෙත පුහුණු පාඨමාලා පැවැත්වීමේ වගකීම පවරාදීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂවලදි පිළිවෙලින් පාඨමාලා 07 ක් හා 09 ක් පවත්වා තිබුණි.
(ඇ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනවලට කාර්යමණ්ඩලය බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැලකී සිටිය යුතු වුවද, එකී උපදෙස්වලට අනුගත නොවී 2020 හා 2021 වර්ෂවලදී නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු. 2,899,002 ක මුදලක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.
(ඉ) 2000 ජනවාරි 11 දිනැති පිළිෆ්/පිරී 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන්ට දීමනා , දිරිගැන්වීම් දීමනා සහ වෙනත් මුල්‍යමය ප්‍රතිලාභ ගෙවීමේදි අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා හෝ මහා භාණ්ඩාගාරය අනුමත කරනු ලැබූ ප්‍රතිලාභ පමණක් ගෙවිය හැකි බව දක්වා තිබුණි. ඒසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී නිසි අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන්ට රු.630,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2010 මැයි 14 වන දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කාර්යාල හැකිතාක් දුරට රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබියදී සහ

කළමනාකරණ මණ්ඩලය විසින්ද කාර්යාලය පවත්වාගෙන යාමට පමණක් ඉඩ පහසුකම් ඇති ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලෙස අවධාරණය කර තිබ්දියදී, දැනට ආයතනය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන වසර දෙකක් සඳහා දිර්ඝ කර කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් වාර්ෂිකව රු .16,200,000 ක කුලී මුදලක් ගෙවා තිබුණි. නිලධාරීන් 32 දෙනෙකුගෙන් යුතු සුළු කාර්ය මණ්ඩලයක් වෙනුවෙන් සහ පුහුණු පාඨමාලා පැවැත්වීමට දේශන ශාලා සකස් කිරීම වෙනුවෙන් රු.4,140,643 ක මුදලක් වැය කර තිබුණද, පුහුණු පාඨමාලා මුදල් ගෙවා වෙනත් ස්ථානවල පැවැත්වීම හේතුවෙන් ගොඩනැගිල්ල උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ)අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 2,290,285 ක මුදලක් හා ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් සඳහා ගෙවිය යුතු රු. 2,959,496 ක් වර්ෂ 2කට වැඩි කාලයක් තිස්සේ මුල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් ලෙස පෙන්නුම් කර තිබුණද, මෙම ශේෂ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ එකඟතාවයකට පැමිණ නොතිබුණි.

(ආ) වැඩ තහනමකට ලක් වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ පරිපාලන නිලධාරිනිය විධිමත් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, වැඩ තහනමට ලක් වූ කාලයට අදාලව වැටුප් හා දීමනා ලෙස රු. 666,026ක මුදලක් ගෙවා තිබුණද. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුලදි පෙර පාසල් ගුරුවරුන් සඳහා පැය 100 භාෂා පාඨමාලා 4 ක්, පිරිවෙන් අධ්‍යාපනය ලබන බෞද්ධ භික්ෂූන් වහන්සේලා 200 ක් වෙනුවෙන් වැඩසටහන් 5ක්, දෙමල භාෂා පාඨමාලා වෙනුවෙන් විෂය නිර්දේශ 4 ක් සකස් කිරීම, සිංහල ඩිප්ලෝමා මොඩියුලයක් පිළියෙල කිරීම හා දෙවන භාෂාව ඉගැන්වීමේ සහතිකපත්‍ර සඳහා වූ විෂය නිර්දේශ නවීකරණය කිරීම යන කාර්යයන් 05 ක් ඉටු කිරීම සඳහා රු. 1,569,000 ක පිරිවැයක් දැරීමට සැලසුම් කර තිබුණද, එකී කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති